# ශ්‍රී ලංකාවේ සධාතුක බුද්ධ ප්‍රතිමා පිළිබඳ විමසුමක්

ටී.එම්.ජී.ඩී.වී. බණ්ඩාර

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
bs201950@bpu.ac.lk

**මුඛ්‍ය පද** - සධාතුක බුද්ධ ප්‍රතිමා, සමන්තපාසාදිකාවිනයාට්ඨකථාව, මනෝරථපූරණී අටුවාව, දක්ෂිණවිභංගඅටුවාව, ගඩලාදෙණි පර්වතලිපිය

## හැඳින්වීම

මහාවංස විස්තරයට අනුව මෙරට පළමු බුද්ධ ප්‍රතිමාව ක්‍රි.පූ. තුන්වන සියවසේ නිර්මාණය කර ඇත (මහාවංශය 36, 128-129). වනරතන හිමියන් මුල්කාලීන බුද්ධ ප්‍රතිමාවල ධාතු නිධන් කිරීමෙන් එය ශාරීරික ධාතු වශයෙන් සැලකීම මිස උද්දේසික ධාතු සංඥයට අයත් නොවන වස්තුවක් වශයෙන් සැලකූ බව පවසති. මෙතෙක් නිර්මාණය කරන ලද බුද්ධ ප්‍රතිමා පිළිබඳ අවධානය යොමුකිරීමේ දී සධාතුක බුද්ධ ප්‍රතිමා පිළිබඳ අදහසක් ගොඩනගා ගත හැකි වනුයේ, සාහිත්‍යය මූලාශ්‍රය තුළ සධාතුක බුද්ධ ප්‍රතිමා පිළිබඳ විස්තර කරන බැවිනි. මුල් කාලීනව බුද්ධ ප්‍රතිමාවන් කළුගලින් නිර්මාණය කර ඇත. අටුවා හා වෙනත් මූලාශ්‍රය තුළ සධාතුක පිළිම පිළිබඳ විස්තර වන බැවින් මෙම බුද්ධ ප්‍රතිමාවල හිස මුදුනේ ඇති කුඩා සිදුර ධාතු තැන්පත් කිරීමට නිර්මාණය කර ඇති බවත්, කුඩා කරඬු හා සුර තුළ ධාතු තැන්පත් කොට එම සිදුර තුළ තැන්පත් කරන්නට ඇති බවත් උපකල්පනය කළ හැක. නමුත් ඇතැමුන්ගේ අදහස නම් මෙම ශීර්ෂමස්තක කුඩා සිදුරු සිරස්පතය සවි කිරීමට යොදාගත් බවයි (හේරත්, 2003, 93). ඒ අනුව මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ ලේඛනගත සාධක පදනම්කර ගනිමින් ශ්‍රී ලංකාවේ පවතින බුද්ධ ප්‍රතිමා අතර සධාතුක බුද්ධ ප්‍රතිමා පිළිබඳ අධ්‍යයනය කිරීමයි. එම කරුණු තහවුරු කරගැනීම උදෙසා ක්ෂේත්‍රය තුළ ව්‍යාප්තව පවතින පුරාවිද්‍යා සාධක කෙතරම් දුරට දායකවන්නේ දැයි මූලික වශයෙන් සාකච්ඡා කිරීමට මෙම අධ්‍යයනය තුළින් බලාපොරොත්තු වේ.

## ක්‍රමවේදය

තොරතුරු ඒකරාශී කිරීමට තෝරාගත් ප්‍රධාන ක්‍රමවේදය ලෙස මූලාශ්‍රය පරිශීලනය පෙන්වා දිය හැක. එසේම ක්ෂේත්‍ර නිරීක්ෂණය හා කේවල අධ්‍යයන ආදී පර්යේෂණ විධික්‍රම මේ සඳහා යොදාගන්නා ලදි. කෞතුකාගාර අධ්‍යයනය කිරීම මඟින් වැඩිදුර තොරතුරු රැස් කළ අතර ඡායාරූප ලබාගැනීම සඳහා අන්තර්ජාලය භාවිත කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ක්‍රි.ව. 05 වැනි සියවසේ අට්ඨකතා රචනා කළ බුද්ධඝෝෂ හිමියන් එම ලේඛනවල ධාතු තැන්පත් කරන ලද බුද්ධ ප්‍රතිමා දෙකක් පිළිබඳ දක්වා ඇත(හේරත්, 2005: 34). සමන්තපාසාදිකාවිනයාට්ඨකථාවට අනුව පණ්ඩිතයන් ධාතු සහිත ප්‍රතිමාවක් හෝ චෛත්‍යයක් හෝ තබා බුද්ධ ප්‍රමුඛ උභතෝ සංඝයාට දන්දෙන බව විස්තර කර ඇත.

මනෝරථපූරණී අටුවාවට අනුව සධාතුක ප්‍රතිමාවකට හානි සිදුවේ නම් ඊට හේතුවන බෝ අත්ත කපා ඉවත් කිරීමට අවසර ලබා දී ඇත (අඞ්ගුත්තරනිකායට්ඨකතා, 2009:2006). එය "සධාතුකං පන ථූපං වා පටිමං වා බාධමානං බොධිසාඛං ඡින්දිතුං වට්ටති.." වශයෙන් දැක්විය හැක. මෙයට සමාන වූ අදහසක් සම්මෝහවිනෝදනී විභංග අටුවාවේ ද සඳහන් කර ඇත. බුදුන්වහන්සේ පිරිනිවන්පා වදාළ කල්හී උභතෝ සංඝයා මැද සධාතුක බුද්ධ ප්‍රතිමාවක් තබා පළමුව සාංඝික දානය දියයුතු බව දක්ෂිණ විභංග සූත්‍ර අටුවාවේ "තථාගතෙ පන පරිනිබ්බුතෙ උභතො සංඝස්ස පමුඛෙ සධාතුකං බුද්ධපටිමං ආසනෙ ඨපෙත්වා පත්තං ආධාරකෙ ඨපෙත්වා දක්ඛිණොදකමාදිං කත්වා සබ්බං සත්ථු පඨමං දත්වා උභතෝ සංඝස්ස දාතබ්බං...'' යනුවෙන් දක්වා ඇත (මජ්ඣිමනිකායට්ඨකතා, 2008).

ගඩලාදෙණිය පර්වත ලිපියේ දැක්වෙන පරිදි "ශක්‍ර බ්‍රහ්ම සූයාම සන්තුෂිත නාථ මයිත්‍රී ආදී දෙවියන් විසින් පිරිවරන ලද වජ්‍රාසනාරූඪවූ බෝධීන්වහන්සෙට පිටලා වැඩහුන් සධාතුක මහ පිළිම සාමි (නුග) අනු පිළිම දෙදෙනා වසන්සේත් (නො).." ධර්මකීර්ති හිමියන් විසින් ගණෙශ්වරාචාරීන් ප්‍රමුඛ ශිල්පීන් ලවා නිර්මාණය කරවන ලද තෙමහල් ප්‍රතිමා ගෘහයේ පහත මාලයේ ශක්‍ර, බ්‍රහ්ම, සූයාම, සන්තුෂිත, නාථ හා මෛත්‍රී ආදී දෙවිවරුන් පිරිවරා ගනිමින් වජ්‍රාසනාරූඪව බෝධීන්වහන්සේට පිටලා වැඩසිටින සධාතුක බුද්ධ ප්‍රතිමාවක් හා පරිවාර ප්‍රතිමා වහන්සේලා දෙනමක් පිළිබඳ තොරතුරු සඳහන් වේ (ibid, 2007: 28).

මෙම කරුණු තුළින් මෙරට සධාතුක බුද්ධ ප්‍රතිමා ආරම්භයේ සිට පැවති බවට උපකල්පනය කළ හැක. අනුරාධපුර හා පොළොන්නරු ආදී කාල පරිච්ඡේදයට අයත් කලා නිර්මාණ පිළිබඳ අවධානය යොමු කිරීමේ දී, ඇතැම් පිළිමගෙවල් තුළ ඇති බුද්ධ ප්‍රතිමාවල ශීර්ෂය දක්වා පසෙකින් පියගැටපෙළක් නිර්මාණය කර ඇත. මෙසේ නිර්මාණය කරන ලද පියගැටපෙළ බුද්ධ ප්‍රතිමාවේ ශීර්ෂ වන්දනාව සඳහා යොදාගන්නා ලද බවට උපකල්පනය කළ හැක. මෙසේ බුද්ධ ප්‍රතිමාවල ශීර්ෂය වන්දනා කිරීම සිදුකර ඇත්තේ ප්‍රතිමාවේ ධාතු තැන්පත් කිරීම ශීර්ෂමස්තකයේ සිදුකළ නිසා විය හැක. අනුරාධපුර ඇතුල් නුවර පිහිටි ගෙඩිගේ තුළ ද මෙවැනි ආකාරයේ පියගැට පෙළක් පවතී.

පළමුවැනි උපතිස්ස රජු (ක්‍රි.ව. 368-410) සනරන් ප්‍රතිමාවක් කර වූ බව මහාවංසයේ සඳහන්වන අතර, ස්වර්ණමය වූ සර්වඥධාතු සහිත ප්‍රතිමාවක් කර වූ බව දීපවංශයේ දෙවැනි භාගයේ සඳහන් වේ.

මෙලෙස බැලූ විට පෙනී යන්නේ බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමේ දී ධාතු සහිත හා ධාතු රහිත ප්‍රතිමා නිර්මාණය කර ඇති බවයි. එය සාහිත්‍යගත තොරතුරු මඟින් අනාවරණය වන අතර, ක්ෂේත්‍රය තුළ පවතින සාධක මඟින් උපකල්පනයකට ද එළැඹිය හැකිය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

***පපඤ්ච සූදනී මජ්ඣිමනිකායට්ඨකතා***, (සං. දේවසිරි හිමි. ආඳාවල), 2008, නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

***මනෝරථපූරණී අංගුත්තර නිකායට්ඨකථා,*** (සං. අභයවර්ධන. කපිල), 2003, ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සංගමය.

***මහාවංශය ප්‍රථම භාගය.*** 2015 (1912). ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ.

***සමන්තපාසාදිකා***, (සංස්.විපස්සි හිමි. රඹුක්වැල්ල), 2005, කොළඹඃ සමයවර්ධන ප්‍රකාශනය.

Rohanadheera, M. (2007), **Inscriptionas of Ceylon, Vol.VII**, , Department of Archaeology, Colombo.